# සාහිත කලාවට අත සිත යොමුකළ






## ආචාර්ය පාලිත ගණේවත්ත

ඕස්ට්‍රේලියානු ශ්‍රී ලාංකික ප්‍රජාවට අනුපමේය සේවාවක් සත්කාරයක් ඉටුකරන සිනුවර ආචාර්ය පාලිත ගණේවත්තයන් ගේ ග්‍රන්ථ අතරට " ගුණදාස අමරසේකර සංවාද හා "දොස්තර චෙකෝෆ් " යන නවතම ග්‍රන්ථ ද්විත්වය නිකුතුව පසුගිය ජූනි 13 වනදා සිනුවර නෝර්ත් රොක් හි ඩොන්මෝර් ප්‍රජා ශාලාවේ දී පැවැත් වුනා.

සිනුවර සිංහල සංස්කෘතික හමුවට අනුබද්ධිත සිංහල ලේඛක සංසදය එකමුතුවෙන් හා ඉදිරිපත් කිරීමෙන් හැඩ වැඩ වූ මේ ග්‍රන්ථ එළිදැක්වීම ආචාර්ය දොන් වික්‍රම, ආචාර්ය පියසෝම මේදිස්, ගීත රචනයේ ප්‍රවීන වූ අධිනීතිඥ මෛත්‍රී පනාගොඩ යන විද්වතුන් ගේ දේශන හා සාහිත ලැදි සම්භාවනීය පිරිසක් මාධ්‍යයේ එළිදැක්වීම තවත් සාහිත ලකුණක්.

අව්‍යාජ නිර්මාණකරුවෙකු තුලින් නැගෙන වචන සමුදායක් මුවින් බැහැර කල ගණේවත්තයන් ගේ ස්තුතිය හා සිනුවර ආචාරය මේ අතර ම අගය කරනු වටී. ග්‍රන්ථ ද්විත්වය පිළිගැන්වීම කිත්සිරි කරුණාරත්නයනට හා පාලිත ගණේවත්තයන් ගේ දියණියටත් පුතුනුවණටත් වීම තවත් සුබදායී කටයුත්තක්. ආචාර්ය දොන් වික්‍රම හා එක්ව සිනුවරින් SBS ඉරුදින දහවල් සිංහල නාලිකාව පණ ගැන්වූ පාලිත පසු කලකදී තනිවම එම සිංහල නාලිකාවේ වැඩ කටයුතු නොකඩවා කරගෙන ගියේ ශ්‍රී ලාංකීය ප්‍රජාවට මහගු සේවයක් හා යුතුකමක් ඉටුකරමින්.

ග්‍රන්ථ ද්විත්වය නිකුතුව එළිදැක්වීම ශ්‍රී ලංකාවේ ද 2013 පෙබ 25 වනදා කොළඹ රුසියානු සංස්කෘතික මධ්‍යස්ථානයේදී සිදුවුනා. මෙහිදී ප්‍රධාන දේශකයන් ලෙස ගුණදාස අමරසේකර, මහාචාර්ය සරත් විජේසූරිය,ප්‍රවීන ගීත රචක සුනිල් සරත් පෙරේරා, අධිනීතිඥ ඩබ්.ඒ.අබේසිංහයන් හා නිර්මාණකරුවන්,සහභාගීවන්නන් රැසක් එකතුවුනා.

ග්‍රන්ථ ප්‍රකාශණයේ මූලිකත්වය දරණ එස්.ගොඩගේ මහතා ගේ සහභාගීත්වයත් රේණුකා බාලසූරිය ගේ සහාව මෙහෙයවීමේ කටයුතු වලින් ලංකාර වූ අතර " ගුණදාස අමරසේකර සංවාද හා ජගත් කීර්තිධර "දොස්තර චෙකෝෆ් " සාහිතධරයා ගැන ආචාර්ය පාලිත ගණේවත්තයන් ලියූ "දොස්තර චෙකෝෆ්" ග්‍රන්ථයද බොහෝ ප්‍රසංසාවට අගැයුමට ලක්වුනා

කල්දෙමුල්ල


ආචාර්ය දොන් වික්‍රම


ගීත රචනයේ ප්‍රවීන වූ අධිනීතිඥ මෛත්‍රී පනාගොඩ


ආචාර්ය පියසෝම මේදිස්,


කිත්සිරි කරුණාරත්න සමග




ග්‍රන්ථ ද්විත්වය පිළිගැන්වීම අධිනීතිඥ ඩබ්.ඒ.අබේසිංහයන් හා ගුණදාස අමරසේකරයන් සමග


පැමිණි පිරිසෙන් කොටසක්





ආචාර්ය පාලිත ගණේවත්තයන් සිය බිරිඳ දූ දරුවන් සමග

